ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
E N G L A N D

Phone & Fax : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
Editor : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
Art : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
Computer Graphics : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
Photography : Ananda Kariyawasam



හැරිස්ගේ කඩදාසි කොටියා

වසර කිපයකට පෙර රොල්ෆ්ප් හැරිස් නම් සුප්‍රකට කාටූන් චිත්‍ර ශිල්පියා බී බී සී රූපවාහිනිය සඳහා ළමා වැඩසටහනක් මෙහෙයවමින් කාටූන් චිත්‍රකලාවේ සජීවිකරණය හෙවත් **ඇනිමේෂන්** ක්‍රියාවලිය විස්තර කරන අයුරු මම බලාසිටියෙමි. ඔහු සාමාන්‍ය **A 4** සුදු කොළයක් ගත්තේය. කලු පෙල්ට් පැනකින් තනි රේඛාවකින් එහි කොටියෙකුගේ රූපයක් ඇන්දේ ය. රොල්ෆ්ප් චිත්‍ර අඳින්නේ කතා කරන ගමන් ය. “දැන් මං මේ ඇන්ද කොටියා සම්පූර්ණ නෑ. අපි මුට දාමු ටිකක් දිග වල්ගයක්. මේ තමයි කොටියගේ පුල්ලි.” ඔහු පැනෙන් තිත් තැබීය. “මදි... තව ටිකක් දාමු.... කොටියට වයිරනුත් ඕන නේ... ඒව නැතුව කොටියා කියලා අඳුරගන්න අමාරුයි...” ඔහු ඒ සියල්ල සම්පූර්ණ කළේය. “කෝ මේ කොටියා රොඳු මදි... තව රුවුල් ගස් කිපයකුයි...විලිස්සන උල් දත් දෙකකුයි දාමු....ඔන්න දැන් ආව කොටියගෙ ඒ භයානක පෙනුම....” ඔහු කීවේ සැබෑවකි. මුලින් රේඛාවෙන් ඇන්ද කොටියාට වඩා දැන් එතන ඉන්නේ ඇඟට පනින්නට කුරුමාණම් අල්ලන සම්පූර්ණ භයානක කොටියෙකි.

බොහෝ කලකට ඉහත මා දැක තිබුණු ඒ කාටූන් ක්‍රියාවලිය ගිය සතියේ හදිසියේ මගේ සිහියට නැගුණේ කිලිනොච්චිය වැටෙද්දි කොටි ත්‍රස්තවාදීන් පලාගොස් ඇති බව ඇසූ විට ය. මෙතෙක් කල් සෙසු ලෝකයාට ද, ශ්‍රී ලංකාවේ අපටද පුම්බා පෙන්වූ කොටියා කැලේ වෙසෙන සැබෑ කොටියාගේ තත්වයේ එකෙක් නොව කාටූන් වල මෙන් පැනෙන් ඇඳ පුම්බා තැබූ කඩදාසි කොටියෙකු බව දැන් සමස්ත ලෝකයාටම නිසැකවම වැටහී ඇති සත්‍යයකි. ඌට ආරූඪකර තිබූ බොරු ගාම්භීරත්වය හා භයානක පෙනුම ගරාවැටුණු බිත්තියක් මෙන් කඩා වැටී කොටියා දැන් පණබේරාගෙන, කැලේ කඩා ගෙන දුවන හිවලෙකුගේ තත්වයට වැටී ඇත.

මෙසේ ත්‍රස්තවාදී මිනීමරු කොටියාට නැති ගාම්භීරත්වයක් හා උදාර මානුෂික පෙනුමක් ආරූඪ කරනලද්දේ කවුරුන් විසින් ද? ඔවුහු නම් නෝර්වේ ඇතුලු බටහිර රටවල්වල නියෝජිතයෝ, බීබීසී මාධ්‍යකාරයෝ, සාමකාක්කෝ, ලංකාවේ බඩජාරි හා බලයේ රැඳී සිටීමට කෑදරකම පමණක් ඇති, දුරදක්නා නුවණක් නැති, කුණු දේශපාලක නායකයෝ වෙති. මේ ආදි පිසාචයින් විසින් කරටගෙන පුම්බා තබන ලද කොටියා කිසිකලෙක පරාජය කළ නොහැකි අනභිබවනීය උත්තරීතර සත්වයෙක් හැටියට අභිෂේක ලබා සිටියේය. එහෙත් කොටි යනු ගම්වලට පැන අහිංසක මිනිසුන් කපා කොටා මරණ, රටේ ජනතාව යන එන රැස්වන තැන් වල බෝම්බ පුපුරවා ඝාතනය කරන ශිලාචාර ලෝකයට කිසි වැගත්කමක් නැති මහ පෙරේතයින් කල්ලියක් පමණක් බව හොඳින් දැන සිටියේ ශ්‍රීලංකා ත්‍රිවිධ හමුදාව, ලංකාවේ සැබෑ මාධ්‍යවේදීන් කිප දෙනෙක් හා රටට හිත ඇති දේශපාලකයින් හා විද්වතුන් සුලුපිරිසක් පමණි.

ප්‍රභාකරන් කොටියා ලකුණ තෝරාගත්තේ සිංහළ ලාංජනය වූ සිංහයා සමග හැපෙන්නට සිතාගෙනය. එහෙත් ලෝකයේ සිංහයා කොටියාට පරාජය වූ බවක් කිසිදාක අප අසා නැත. මක්නිසාද සිංහයා හැමවිටම සිංහයා නිසා ය.

Photo - by (late) Ajith Dahanayake *අජිත් දහනායක*

බුදු පහස ලද තැන ගොඩනැගූ
කැළණි විහාරය

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් කැළණි විහාරය කොළඹ සිට කිලෝ මීටර් 10 ක් පමණ දුරින් කැළණි නදිය අසබඩ පිහිටා ඇත.

සිංහල රාජවංශයේ, මහානාග රජ පුත් යටාලතිස්ස කුමරා කැළණිය ඉදි කරවා එහි රාජ්‍යය කරමින් කැළණි විහාරයේ පස්මහල් පායක් ඉදි කළ බව සඳහන් වේ. ඉක්බිති රජ පැමිණි කැළණිතිස්ස රජුගේ කාලයෙහි මෙහි බොහෝ භික්ෂූන් වහන්සේලා වැඩ සිටි බව ද පැවසේ.

මෙම රජතුමා රහතන් වහන්සේ නමක් ගැන අස්ථාන සැකයක් පහළ කර, උන්වහන්සේ තෙල් කටාරමක ගිල්වා මැරවූ අපරාධය නිසා දෙවියන් කෝප වී මුහුද ගොඩ ගැලීමට සැළැස් වූ බව ද, ඉන් මිදීම සඳහා රජු තමාගේ දූ කුමරිය කුඩා නැවක තබා මුහුදේ පා කර හැරී බව ද පැවසේ.. පාවී ගිය එම නැව රුහුණේ දී ගොඩට පාවූ බවද, එවකට මාගම රජ කළ කාවන්තිස්ස රජතුමා කුමරිය බේරාගෙන ඇය සිය අගමෙහෙසිය තනතුරේ තබාගත් බව ද පොතපතේ සඳහන් වෙයි. **දේවී** නම් ඒ රජබිසව පසුව **විහාර මහා දේවී** නමින් හැඳින් විණ. එකල දෙමළ ආක්‍රමණයට ගොදුරුව තිබූ ලංකාවේ උතුරු පෙදෙස එකී ආක්‍රමණයෙන් මුදවා ගෙන ශ්‍රී ලංකාද්වීපයත්, බුද්ධාගමත් රැකගෙන ලංකාව එක සේසත් කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ දුටුගැමුණු මහරජ තුමාගේ මව ඇය වූවා ය. එම නිසා කැළණි පුරවරය ශ්‍රේෂ්ඨ ජාතික වීරවරියකගේ ජන්මභූමිය ද වෙයි.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවන වසරෙහි වෙසක් පුන් පොහෝ දින තෙවන වරට ලක්දිවට කැළණියට වැඩම කළහ. එය සිදුවූයේ මණිඅක්ඛිත නා රජු නාගදීපයෙහි දී බුදුරජුන්ට කළ ඇරයුමක් අනුව ය. නා රජු මණ්ඩපයක් කරවා මාහැඟි මැණික් පුටුවක් ද බුදුරදුන් සඳහා පිළියෙල කළේය. බුදු රජාණන් වහන්සේ වැඩහිඳ, දන් වළඳා, දහම් දෙසූ එම අගනා මැණික් පුටුව නිදන් කරවා චෛත්‍යයක් කරවන ලදී. එය වී ගොඩක (ධාන්‍යාකාර) හැඩයෙන් යුක්ත ය.

අනුරාධපුරයේ රජකළ කනිට්ඨතිස්ස රජු, දඹදෙණියේ රජකළ 2වෙනි පරාක්‍රම බාහු ආදී රජවරු විසින් කැළණි විහාර භූමියෙහි පස්මහල් ප්‍රාසාද, පිළිම ගෙවල්, විනය කර්මකරන ස්ථාන, ආදී නොයෙක් ගොඩනැගිලි සාදවන ලදී. තවද විහාරයේ හතරැස් මහා මලුව ගල් අතුරා සම තලා කරවා මණ්ඩපයක් ද කරවන ලදී.

ජයවර්ධනපුරය කෝට්ටේ රාජධානිය වීමත් සමගම කැළණිය නැවතත් ප්‍රධාන පූජනීය ස්ථානයක් බවට පත්වූ අතර, එතැන් පටන් එය **කැළණි රජ මහා විහාරය** නමින් ප්‍රසිද්ධ වීය. කෝට්ටේ රජ කළ හයවන ශ්‍රී පරාක්‍රමබාහු රජු කැළණියේ විහාර රැසක් කරවා ඇත.

හයවෙනි භුවනෙකබාහු රජු කාලයේ කැළණිය පෙරදිග වෙනත් බෞද්ධ රට රාජ්‍යයන්හි පවා ප්‍රසිද්ධියට පත්වීය. එකල බුරුම රට ධම්මචේතිය රජතුමා විසින් බුදුරදුන් කැළණි ගඟේ ජල ස්නානය කළ ස්ථානයෙන් උපසම්පදාව ලබා ගැනීමටත්, පිරිසිදු බුදු දහම ලබා ගැනීමටත් බුරුම භික්ෂූන් ලංකදිවට එවන ලදී.

කැළණිය සම්බන්ධ පූජණීය දිනය වෙසක් පුන්පොහෝ දිනය වුව ද, වර්ෂ අවසානයේ සිරිතක් වශයෙන් දුරුතු මහ පෙරහැර පැවැත්වේ. මෙය දෙවෙනි වන්නේ මහනුවර ශ්‍රී දළදා පෙරහැරට පමණි.

කැළණි විහාරයේ චිත්‍ර දහනව වන සිය වසට අයත් පහතරට චිත්‍ර සම්ප්‍රදායට අයත් චිත්‍ර වශයෙන් සැළකේ. පැරණි විහාර ගෙට යාබදව තනා ඇති අළුත් විහාර මන්දිරය අති දර්ශණීය කලාගාරයක් බඳුය. සෝලියස් මැනදිස් නමැති සුප්‍රකට කලාකරුවා නිමකළ එම සිතුවම් ලෝක ප්‍රසිද්ධ ය. නව මුහුණුවරක් ගෙන ඇත. වෙනත් විහාරවල සිතුවම් බුද්ධ චරිත වලට සම්බන්ධ වන අතර කැළණි විහාරයේ චිත්‍ර නිර්මාණය වී ඇත්තේ සිංහල ජාතියේ උපතේ පටන් මහනුවර අවධිය දක්වා ජාතික හා ආගමික සිද්ධීන් ඇතුළත් වන පරිද්දෙනි.

සන්දේශ කාව්‍යවල කැළණි චෛත්‍යයේ විස්තර දක්වා තිබේ. මේ සැළලිහිණි සංදේශයේ එන එක් කවකි.

අහ සින් අවුත් මණිඅක්
නයිඳු යැදූ මට
රහ තන් මැදෙහි මුණි
හිඳ මිණි පළඟ පිට
දහ මුත් දෙසූ තැන කළ
සැට රියන් කොට
මහ දාගප් හිමින් වඳු
සොළස තැන් සිට

කැළණිය නාග ගෝත්‍රිකයින් විසූ පෙදෙසක් බව මෙයින් සිතිය හැකි ය.

♦ ***පියදාස ඉලුප්පිටිය***
විශ්‍රාමලත් අධිකරණ රෙජිස්ට්‍රාර්
දොම්පේ Sri Lanka

❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

හිතොපදේශයෙන්

නිරුත්සාහං නිරානන්දං නිර්වීර්ය මරිනන්දනම්
මාසය සීමාන්තිනො කා විජ්ජනෙත් පුත්‍ර විදෘගම්

අර්ථය : **උත්සාහ නැති, නිරානන්දවූ, වීර්ය නැති, සතුරන් සතුටුකරන පුතෙකු ස්ත්‍රියක ප්‍රසූත නොකෙරේවා !**

ආදරණීය මව්වරුන් විසින් මෙලොවට දායාද කරනු ලබන්නාවූ දූ පුතුන් මහා උත්සාහයකින් යුතුවූද, ලද දෙයින් සතුටු වන්නාවූද, ආරම්භකරන ලද දේ නොනවත්වාම වීර්යයෙන් කරගෙන යන්නාවූ ද කෙනෙකු විය යුතු බවත්, එසේ නොවන අය සතුරන් සතුටු කරන අය ලෙස සැලකෙන අතර එවැන්නන් කිසිම මවක විසින් බිහි නොකෙරේවායි යන්න මෙම කාව්‍යයෙන් ඉදිරිපත් කරන අදහසයි.

කටයුතු ආරම්භකිරීමේදී හා එම කටයුතු සඵල කරගැනීමේදී උත්සාහය, උද්‍යෝගය හා උනන්දුව අත්‍යවශ්‍යය. උත්සාහයෙන් තොරව කිසිම ක්‍රියාවකින් ඵල නෙලාගත නොහැකියි. උත්සාහය ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ ලක්ෂණයකි. උත්සාහයෙන් තොරව දෛවයෙන් සියල්ලක්ම සිදුවන බව ලාමක පුද්ගලයන්ගේ සිතිවිල්ලකි. එනිසා දෛවය පසෙක ලා ආත්ම විශ්වාසය පෙරටු කොට උත්සාහ කිරීම ප්‍රඥාගෝචරය. කුසීතව කිසිවක් නොකොට ඉන්නවාට වඩා උත්සාහයෙන් යමක් කොට ඉන් තමා බලාපොරොත්තුවූ ප්‍රතිඵලය නොලැබුණත් එහි දොසක් නැති බවත්, ඒ ගැන පසුතැවිල්ලක් දුකක් නොවන බවත් උපදෙස් සාහිත්‍යයේ එයි. භෞතික වස්තූන් ලෙස සලකන ඉදිකටුවේ සිට අහස උස සුවිසල් මැදුරු, ගුවන් යානා ආදී සියළුම දේ යමෙකුගේ හෝ සමූහයකගේ උත්සාහයන්හි ප්‍රතිඵල මිස ස්වයං නිර්මාණ නොවේ. එනිසා උත්සාහය පුද්ගලයෙකු සතු වටිනාම ගුණධර්මයයි.

දෙවැන්න නිරානන්දයයි. ලද දෙයින් සතුටු නොවීමයි. තණ්හාධික පුද්ගලයා කිසි දිනක ලද දෙයින් සතුටුවන්නෙකු නොවේ. සීමාරහිත ආශාව, මහා සාගරය හා ගින්නට උපමාකර ඇත. සතර දිශාවෙන් ගලා එන මහා ගංගා ජලය මහමුහුදට එකතු වුවද මහා සාගරය ඉන් පිරී ඉතිරී නොයන්නාක් මෙන් ද, ගින්නට දමන දහනය වන පිදුරු, දර ආදි ඕනෑම ඉන්ධනයක් සැනෙකින් දවා හළු කරන්නාක් මෙන්ද වස්තු තණ්හාවෙන් පිරී තණ්හාධික පුද්ගලයාට කිසිදු දෙයකින් සෑහීමකට පත්විය නොහේ.

මෙහි සඳහන් තෙවැන්න පළමුවැන්න හා සම්බන්ධ වීර්‍ය නොකිරීමයි. කෙනෙකුට කටයුතු ආරම්භකිරීමට උත්සාහයත්, එය නොනවත්වා ඉදිරියට ගෙනයාමට වීර්‍යයත් අවශ්‍ය වෙයි. වීර්‍යයේ අනෙක් පැත්ත උදාසීනබව, කුසීතබව, කම්මැලිකම, අලසබව හා කයේ හා සිතේ හැකිලීම් ගතියයි.

යහපත් පුද්ගලයෙකුගේ පැවැත්මට ඉහතින් දැක්වූ කාරණා තුනම අත්‍යවශ්‍යය. ලෞකික ජීවිතය සමබරව පවත්ගැනීමටත්, අධ්‍යාත්මික දියුණුව ලබාගැනීමටත් මේවා එකසේ ප්‍රයෝජනවත් ය.

2009 වසරේ හිණිපාමුල සිටින අපට එය තරණය කිරීම තරමක් අසීරුවනු නොඅනුමානය. කරදර දුක් ගැහැට සිත් තැවුල් මෙන්ම සතුට සොම්නස පිරී සිනාවද, කඳුලද එකසේ හෝ වෙනස්ව උරුම වනු ඇත. අටලෝ දහමින් කම්පා නොවී ගැටළු හමුවේ බිය නොවී, ධෛර්‍යයෙන් යුතුව ඒවාට මුහුණ දී හොඳින් ජීවත්වීමට වග බලාගැනීම නුවණට හුරුය.

♦ ***පූජ්‍ය විල්ඔය***
විමලජෝති හිමි
ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya
The Avenue
London W41UD UK

ANOOMA & HEGODA
Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 0 2 0 8 3 4 8 7 7 7 2

Colombo Office
Visa Refusals
Property Purchase in Sri Lanka

Hegoda & Hegoda
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632